

පැතිකඩ

ආචාර්ය පාලිත ගනේවත්ත

ඩී.බී. ගේ සාහිත්‍ය සේවාව 8

සංගම්කාරයාගේ මළගම

ඩී. බී. කුරුප්පු මහතාගේ සාහිත්‍ය නිර්මාණ අතර පරිවර්තන පොත් කිහිපයක් ඇත. මේ ලිපියෙක් ඔහුගේ 'සංගම් කාරයාගේ මළගම' නැමැති පොත විමසා බැලීමට අදහස් කරමි. අන් බසකින් තම මව්බසට පෙරළීමේදී පරිවර්තනය යන වදනට වඩා අනුවාදය යන වදන උචිතය. මෙහිදී පළමු බස මුල් බස යනුවෙන්ද පරිවර්තනයෙන් පසු පාඨකයා අතට එන පොතේ බස අන් බස යනුවෙන්ද හැඳින්වීමට කැමැත්තෙමි. "සංගම්කාරයාගේ මළගම" පොතේ මුල්බස ඉංග්‍රීසියයි. අන්බස් සිංහලයයි.

පරිවර්තනය යන්නෙන් මුල් බසේ වදනින් වදන එයට සරිලන කෝතාර්ථ පදයට පෙරළීමක් අදහස් වෙතැයි සිතමි. ස්වභාවික විද්‍යා විෂයන් පිළිබඳ ග්‍රන්ථ අන්බසකට පෙරළීමේදී පරිවර්තනය අවශ්‍ය වෙයි. එහෙත් කෙටි කතාවක්, නවකතාවක් වැනි සාහිත්‍ය නිර්මාණයක් අන්බසකට පෙරළීමේදී කළ යුත්තේ මුල් වචනයේ කො....ඊය නොව මුල් බසේ වදනට අනුරූප අරුත් දැනවන අන් බසේ වදන සොයා ගැනීමයි.

වෙනත් විදියකින් කියතොත් මුල් බසේ වදනින් හෙළිවන අර්ථය අන්බසේ වහරින් කීමයි. මේ පරළීමේ ක්‍රියාවලිය හැඳින්විය යුත්තේ අවුවාදය ලෙසය. ඩී. බී. කුරුප්පු මහතා ඉංග්‍රීසි මුල් බසින් සිංහලයට (අන් බස) පෙරලූ සියළුම පොත් අනුවාද ලෙස හඳුන්වා ඇත්තේ මේ නිසා යයි සිතමි.

සාහිත්‍යමය අනුවාදයක් විචාරයට ලක් කිරීමේදී අපගේ අවධානය යොමුවිය යුතු මූලික කරුණු දෙකක් ඇතැයි මම කල්පනා කරමි. පළමුවකිය නම් අනුවාදයේ අනුරූපතාවයි. එයින් අදහස් වන්නේ එම අනුවාදය එම කාලයේදී පළකිරීම කොතරම් සුදුසුද, කාලීන සමාජ සංස්කෘතික අවශ්‍යතාවනට ගැලපේද යන්නයි. දෙවැන්න නම් අනුවාදයේ සාහිත්‍යමය අගය විමසා බැලීමයි. අනුවාදයද මුල් සාහිත්‍ය නිර්මාණයේ ප්‍රතිනිර්මාණයකි. එබැවින් අනුවාදයේ සාහිත්‍යමය අගය විමසිය යුත්තේ එහි බස් වහර විමසීමෙනි.

මුල් බසින් අන් බසට කරන ලද පෙරළීම පදින් පදය ගෙන කළ පෙරළීමක් ද නැතිනම් අන්බසේ වහරට අනුකූලව සිදුකළ පෙරළීමක් ද යන්න විමසා බැලීමයි. ඉංග්‍රීසියෙන් සිංහලයට අනුවාද නිර්මෙදි සාහිත්‍ය නිර්හාණයේ අනුවාදය සිංහල වහරින් ලිවිය යුතුය.

ඩී. බී. ගේ "සංගම්කාරයාගේ මළගම" ඕස්ට්‍රේලියානු කෙටි කතා එකතුවක සිංහල අනුවාදයයි. දහනව වන සියවසේ අග භාගයේ සිට විසිවන සියවසේ අගභාගය දක්වා ඕස්ට්‍රේලියානු කෙටිකතාව තියෝජනය වන කෙටිකතා දහයක් මේ පොතට ඇතුලත් වේ. ඕස්ට්‍රේලියානු අද්‍යතන සාහිත්‍යයේ පියා ලෙස සැලකෙන හෙන්රි ලෝසන්, ඕස්ට්‍රේලියාවේ ප්‍රකට ඉතිහාසඥයෙකු හා සාහිත්‍යධරයෙකු වූ මැතිං ක්ලාක් ඇතුළු ලේඛකයන් නව දෙනෙකුගේ කතා මේ සංග්‍රහට ඇතුලත්ය.

සිංහල සාහිත්‍යයට එක්වුණු පළමුවන ඕස්ට්‍රේලියානු කෙටි කතා සංග්‍රහය මෙයයි.

ඕස්ට්‍රේලියාවේ මෑත ඉතිහාසය ආරම්භ වන්නේ මීට වසර දෙසියයකට මදක් එපිට අවධියේ ඉංග්‍රීසි ජාතිකයන්ගේ පැමිණීමත් සමගය. ඔවුන් පැමිණීමට පෙර මෙම දකුණු මහද්වීපයේ ඇබරිජීන ජාතික ආදිවාසීහු බොහෝ කලක් වාසය කළහ. ඉංග්‍රීසින්ගේ පැමිණීමෙන් පසුව මෙරට ආදිවාසීන්ගේ ජීවන රටාවට විවිජ බලපෑම් ඇතිවිය. මේ බලපෑම් බොහෝවිට ආදිවාසී සම්ප්‍රදායික ජීවන රටාවට අහිතකර විය. මේ හේතුවෙන් සුදු ජාතිකයන් හා ආදිවාසීන් අතර ඇති වූ ගැටුම්, තම ජීවන රටාවට අහිතකර විය. මේ හේතුවෙන් සුදු ජාතිකයන් හා ආදිවාසීන් අතර ඇතිවූ ගැටුම්, තම ජීවන රටාව වෙනස්වීමත් සුදු පාලනයේ නිතිරිතිවලට යටත් වන්නට සිදුවීමත් නිසා ආදිවාසීන් තුළ ඇතිවූ සමාජයීය හා ආධ්‍යාත්මික ගැටුම ඕස්ට්‍රේලියාවේ මෑත ඉතිහාසය පුරා දකින්ට ලැබේ. ඕස්ට්‍රේලියානු නිර්මාණ සාහිත්‍යයේද මේ ගැටුම පිළිබිඹු වෙයි. ඩී.බී. ගේ කෙටිකතා සංග්‍රහයේද මේ ගැටුම නිරූපණය වන කතා දෙකක් ඇතුලත්ය.



තියා ඇස්ටලි THEA ASTLEY (1925 " 2004) ගේ "ගිත ගිය තැන (මාලිගාව) පැල්පතයි" නැමැති කතාව සුදු ඕස්ට්‍රේලියානුවන් විසින් කලු දරුවන් පැහැරගෙන යාමේ බේදවාචකය හොඳින් විවරණය කෙරෙන කෙටිකතාවකි. පොලිස් භටයන් විසින් කලු දරුවන් පැහැරගෙන යාමේදී, තමන්ගේ නිවසේ වාසය කරන ළෙස සුදු ජාතික පවුලක් කලු ජාතික කාන්තාවකට ආරාධනය කරයි. කලු ජාතික කත කාරුණිකක ආරාධනය ප්‍රතික්ෂේප කරයි. තියා ඇස්ටලිගේ එම කෙටිකතාව ගැන අනුවාදකයා දක්වන්නේ මෙවැනි අදහසකි.

..... ගැහැණිය දරුවා සමග පරණ පුරුදු අනතුරුදායක වටපිටාවේ තම ගෝත්‍රිකයන් සමග පැල්පතට ගොස් ජීවත් වන්නට සිතයි. ඇයට පුරුදු පැල්පත සම්පතකි. ආදිවාසීන්ගේ ජීවිතයේ තවත් අංශයක් මෙහිලා පිළිබිඹු කරන්නේ ගෝත්‍රයට ලැදියාව, දරු පෙම සහ පවුලට ඇති බැඳීම බඳු සංකීර්ණ බලපෑම් අතර පවත්නා ගැටීම්ද සමගය. (හැන්දෑවට..... පිට 323 " 324)

1957 දී උපත ලද ආර්ව් වෙලර් ;ඈසෘෂ උඈබඈසෘ* ලියූ 'පැන්සොන් දා' නැමැති කතාව වයස්ගත ආදිවාසියකු වටා ගෙතුණු දුක්බර කතාවකි. තරුණ කල තම වාඩියේ මිනීමැරුමකට පැටලුණු ඔහු සුදු මිනිසුන් විසින් හිරබාරයට ගැනේ. හිරෙන් නිදහස් වූ ඔහු බැටළු ලොම් කපන කම්හලක සේවය කරයි. මහළුව විශ්‍රාම ගිය ඔහු මහ මග ගසක් යට අසරණ ජීවිතයක් ගතකරයි. ඔහුගේ පැන්සොන් පඩිය ද කොලු කුරුවිටන් විසින් උදුරා ගැනේ. දිකන මෙහ වැස්සට මුළු රැයේම තෙමෙන ඔහු පසු දින මියයයි. එම කතාවේ තේමාව කතාවට එක් තැනක දක්වා ඇත්තේ මෙසේය.

"තමාට උරුම වූ රතු බිම නැමැති මව් තුරුල්ලෙන් උගුල්ලා ගෙන සුදු මිනිසා විසින් ඔහු ඉවතට ගෙනෙන ලද්දේ ඔහුට වටහා ගත නොහැකි අපරාධයක් හේතුකොට ගෙනය. (පිට 24)

හෙන්රි ලෝසන් ගේ THE DROVER'S WIFE නැමැති කතාව "සතුන් දක්කන්නාගේ බිරිය" නමින් ඩී.බී. සිංහලට පෙරළා ඇත. 1892 දී හෙන්රි ලෝසන් පළමුවරට පළ කරන ලද මේ කතාවට කැලෑබඳ ගම්මානයක දුක්බර ගැමි ජීවිතයේ සිදුවීමක් පාදක වී ඇත. සතුන් දක්කමින් ගමින් බැහැරව ගිය සැමියා ගැන නොතකා ගේ දොර සියළු වැඩපල තනියම කරගනමින් කුඩා දරුවන් තිදෙනකු බලාගන්නා ගැමි ලියකගේ දෛනික ජීවිතයන්, ස්වාභාව ධර්මය ගැමි ජීවිතය කෙරෙහි පවත්නා ආධිපත්‍යයන් මේ කතාවෙන් විවරණය වෙයි. රෑ බෝවෙත්ම සර්පයෙක් නිවසට ඇතුළුවෙයි. සර්පයා සොයාගන්නා තුරු ගෙදර සිටින බල්ලාන් සමග නිදිවර්පිතව සිටින අයට සර්පයා මරා දැමීමට හැකිවන්නේ එළිවන ජාමයේය.

මෙය ලංකාවේ ගම්බඳ වැසියන්ගේ අත්දැකීමකට බෙහෙවින් සමානය. මේ කතාව ඉංග්‍රීසි බසින් කියවීමේදී එය සිංහලට පෙරළිය යුතු කතාවක් යයි ඩී. බී. ට වහා සිතෙන්නට ඇත. එය සිංහලට පෙරළීමේදී තමනට ඉතා සමීප පරිසරයකදී ලැබූ අත්දැකීමක් විස්තර කිරීමේදී ලබන සතුට වැනි නිර්මාණ ආස්වාදයක් ඩී. බී. කුරුප්පු මහතා ලබන්නට ඇත. මෙය ඕස්ට්‍රේලියානු කතාවක් නොව සිංහල ගැමි පරිසරයෙන් ලැබූ අත්දැකීමක් සේ හැඟෙන පරිදි උචිත බස් වහරක් ඒ කතාවට පිවිසි ඇත්තේ මේ නිසා විය යුතුය.

සාහිත්‍යමය අනුවාදයක් විචාරයට ලක් කිරීමේදී අපගේ අවධානය යොමුවිය යුතු මූලික කරුණු දෙකක් ඇතැයි මම කල්පනා කරමි. පළමුවැන්න නම් අනුවාදයේ අනුරූපතාවයි. එයින් අදහස් වන්නේ එම අනුවාදය එම කාලයේදී පළකිරීම කොතරම් සුදුසුද, කාලීන සමාජ සංස්කෘතික අවශ්‍යතාවනට ගැලපේද යන්නයි.

මුල් කතාවේ බස්වහර අනුව අනුවදයේ බස්වහර වෙනස්වීම දැක්වීමට කදිම උදාහරණයක් ලැබෙන්නේ 'සහ "දම් මගිමය' නමැති කතාව කියවීමේදීය. සිඩිනි නතරාශ්‍රිතව ජීවත්වී 1995 දී මධ්‍යය තෙල්මා ෆෝර්ෂෝ ගේ සහ " දම් මගිමය THE MATESHIP SYNDROME නමැති කතාවේ සිංහලානුවාදයයි. එම කතාවේ වස්තු බීජය සිංහල පාඨකයාට අමුතු සිදුවීම් යයි කිව නොහැකිය. එහෙත් හෙන්රි ලෝසන් හෝ මැතිං ක්ලාක් වැනි ලේඛකයන්ගේ නිර්මාණ හා සසඳා බලද්දී තෙල්මා ෆෝර්ෂෝ (TELMA FORESHOW) ගේ "සහදම් මගිමය" කතාවේ බස් වහර කඨෝර බස් වහරක් ලෙසය මට පෙනෙන්නේ. වැඩි කාලයක් වැඩි අවධානයක් යෙදීමට අපොහොසත්වීඹ නිසාදෝ මුල් නිර්මාණයේ කඨෝර බස්වහර විටින් විට අනුවාදයට ද පිවිසෙයි. සහත සඳහන් වැකිය දෙස බලමු.

"ඔහුගේ සොහොයුරිය ..... ගොත ගස ගසා කරන පාපෝච්චාරණය පුද්ගලයන් වෙතින් උකහා ගැනීමට සමත් වීදියේ පූර්ණවධානය සහිත ප්‍රවේශයකට එළඹියාය. (පිට 89)

මේ වැකියේ තේරුම් ගැනීම අපහසු නොවේ. එහෙත් වැඩි අවධානයක් යොමු කළේ නම් මෙවන් වැකකි වඩාත් නිරවුල්ව ලියන්නට අනුවාදකයාට ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත.

පහත දැක්වෙන වැකිය කියවා බලමු.

"...වටපිට නෙත් යොමු කළ ඔහුගේ දෘර්ශනයට හසුවූයේ පියකරු බවක් දැනවන නොසැලකිල්ලක් " අපිළිවෙළක් හෝ මෙන්සියෙන් ආරඩු කර ගන්නා ලද උදාර පෙනුමක් හෝ රහිතව ගිම මෙන් පිරිසිදුවට දිස් වුණු මැද සාලයයි. (පිටු 88)

මේ වැකිය වියරණ දොසකින් තොර නිවැරදි වැකියෙකි. එහෙත් මේ වැකිය කියවීමේදී පිරිසිදු මැද සාලයක් පිළිබඳ චිත්‍රයක් පාඨකයාගේ මනසේ ඇඳී යන්නේද යන්න සැක සහිතය.

අනුවදයේ ප්‍රතිනිර්මාණයක් බව මම කලින් කිවෙමි. අනුවදයේ මුල් නිර්මාණයටත් වඩා අසීරු

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia